# පුරාණ ලංකාවේ පවුල් සංස්ථාවේ ආර්ථිකය කෙරෙහි කාන්තාවගේ දායකත්වය

එස්.ආර් නදීකා කුමුදිනී සිංහබාහු


## සාරාංශය

මානව ප්‍රජාවෙහි පැවැත්මෙහිලා කාන්තා දායකත්වය වඩාත් වැදගත් වූවකි. කාන්තාව පුරාණ ලංකාවේ පවුල් සංස්ථාවෙහි හා ගෘහ ජීවිතයෙහි ආරක්ෂාව උදෙසා ප්‍රබල දායකත්වයක් දක් වූ බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ඇය බිරිඳක ලෙස ස්වාමි පුරුෂයා වෙත ඉටුවිය යුතු යුතුකම් ද, මවක ලෙස දරුවන් බිහි කොට ආරක්ෂාව සපයමින් පෝෂණය කිරීමේ වගකීම ද, දියණියක ලෙස දෙමාපියන් පෝෂණය කිරීමට ද, තමා සතු ප්‍රධානත ම වගකීමක් ලෙස සලකා කටයුතු කරයි.

පුරාණ ලංකාවේ පැවති කෘෂිකාර්මික අර්ථ ක්‍රමය තුළ විවිධ ආර්ථික දුෂ්කරතා මඟ හරවා ගනිමින් ආර්ථික සුරක්ෂිතතාවක් මෙන්ම මනා කළමනාකාරීත්වයක් ගොඩනඟා ගැනීම උදෙසා කාන්තාවගේ දායකත්වය කෙබඳු ද යන්න විමසීම මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ මෙන්ම පර්යේෂණ ගැටලුව ද විය. ඊට අමතරව, පැරණි ලක්දිව කාන්තාවන් නියැළුණු වෘත්තීන් මොනවාද?, ඒ ඒ වෘත්තීන් තුළ කාන්තා භූමිකාව කෙබඳු වී ද යන්න විමසා බලන අතර ම පවුල් සංස්ථාව තුළ ස්ත්‍රිය මෙන් ම පුරුෂයා සතු කාර්යභාරය විග්‍රහ කොට එහි ස්වභාවය සසඳා බැලීම තුළින් කාන්තාව ආර්ථිකය තුළ දක්වන සම්පත් දායකත්වය පරීක්ෂා කිරීම කෙරෙහි ද මෙම පර්යේෂණයේ දී විශේෂ අවධානය යොමු කර ඇත.

පැරණි ලක්දිව කාන්තාව නොයෙක් ආර්ථික ප්‍රශ්න හමුවේ පවුලේ ආර්ථික සුරක්ෂිතතාවය ගොඩනගා ගැනීම සඳහා විවිධ වූ වෘත්තින් හා ජීවනෝපාය මාර්ගවල නියැළෙමින් විශාල දායකත්වයක් දක් වූ බවත්, ඒ මත

පවුල තුළ ද ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගුණු බවත් මෙහි දී එළඹි උපකල්පනය විය.

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු යුගය අවසානය දක්වා වූ කාලය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස මූලාශ්‍රය අධ්‍යයනය හෙවත් ඓතිහාසික ක්‍රමවේදය යොදා ගත් අතර එහි දී මහාවංසය, පූජාවලිය, ධාතුවංසය, ධම්පියා අටුවා ගැටපදය වැනි ප්‍රාථමික මූලාශ්‍රය ගණනාවක් හා ද්විතීයික මූලාශ්‍රය, ජනප්‍රවාද, ජනශ්‍රැති ආදිය භාවිත කෙරිණි.

සමස්ත පර්යේෂණය ඔස්සේ එළඹි නිගමනය නම්, විශේෂයෙන් ම පුරාතන ලංකාවේ ඓතිහාසික පසුබිම තුළ කාන්තාව ආර්ථික අංශයට විශාල දායකත්වයක් ලබාදුන් බවයි. මෙහි දී විශේෂත්වය වන්නේ, තමා වෙත පවුල් සංස්ථාව තුළ පැවරුණු වගකීම් සියල්ල ඉටු කරමින් ද කාලය නිසිලෙස උපයෝගී කරගනිමින් ද ආර්ථික අංශයට දායක වීමයි. විටෙක, ඇය පුරුෂයා හා සම තත්ත්වයෙන් ද තවත් විටෙක පුරුෂයා අතික්‍රමණය කරමින් ද පවුල තුළ ආර්ථික දායක්තවයක් දැක්වූ බව සමස්ත පර්යේෂණය තුළින් නිගමනය කෙරිණි.

***ප්‍රමුඛ පද*** : කාන්තාව, ආර්ථිකය, පවුල, ශ්‍රී ලංකාව

## ***හැඳින්වීම***

අතීත ලංකාවේ වැසියාගේ ජීවන රටාව ඉතා සරල වූ එකකි. එබැවින් එය සීමාසහිත අවශ්‍යතාවලින් සමන්විත වූ බැවින් ගොවිබිම හා තමා අවට පරිසරයෙන් එම අවශ්‍යතා සපුරා ගත හැකි වීමත්, පීතෘ මූලික සමාජ ක්‍රමයක් පැවතීමත් නිසා ගෙදරදොරේ, ගෙවත්තේ, හේනේ, කුඹුරේ කාන්තාව සතු කාර්යභාර්යය ඉතා විශාල විය. ගෙයි කළේ පැන් පිරෙන්නේත් ලිපෙහි ගිනි

මෙළවෙන්නේත් ගෙයි පිරිසිදුකම රැකෙන්නේත් මිදුලේ මලක් පිපෙන්නේත් ගෘහණිය නිසා බව සකු කතුතුමා පවසන්නේද පවුල තුළ ස්ත්‍රියකගේ කාර්යයභාර්ය බහුවිධ වූ බැවිනි.

"න ගෘහං ගෘහ මුච්‍යතෙ ගෘහණී ගෘහ මුච්‍යතෙ"

වශයෙන් ගෘහණියක් නොමැති නම් ගෘහය ගෘහයක් නොවන බව මනුස්මෘතිය ( මනුස්මෘතිය,1984,3,61-62) සඳහන් කරන්නේ ද එබැවිනි. එමෙන්ම ශ්‍රී ලාංකික බෞද්ධ කාන්තාවන් ද ගේ දොර කටයුතුවලදී ගෘහණියක, මවක ලෙස උපරිම වූ සේවාවක් ඉටු කළා සේම සිය ස්වාමිපුරුෂයාගේ ආර්ථික ක්‍රියාවලියෙහි කොටස්කාරියක ලෙස පවුලේ ආර්ථික සුරක්ෂිතතාවක් ගොඩ නැගීමට ද විශාල ලෙස ශ්‍රමදායකත්වයක් සපයන ලදී. කාන්තාව විසින් ස්වාමියාගේ අවශ්‍යතා, පවුලේ ආරක්ෂාව, ගේ දොර කළමනාකරණය, පවිත්‍රතාවය, ඉවුම් පිහුම් කටයුතු, නිරෝගී දරුවන් බිහි කිරීම, දරුවන්ගේ අධ්‍යාපනය, කුටුම්භය තුළ අන්‍යෝන්‍යය සබඳතා හා ඥාති හිතමිතුරු සබඳතා ඇතුළු යුතුකම් හා වගකීම් රාශියක් පවුල තුළ දී ඉටු කරනු ලැබේ. පවුල සතු කාන්තාවගේ කාර්යභාර්යය මෙසේ ලඝු කොට දක්වුවද ඍග්වේදයෙහි ස්ත්‍රිය ගෘහය හා සමාන බව කියන්නා සේ ම (ඍග්වේද සංහිතා,1996, 3. 5. 3. 4.) සැබැවටම ගෘහයෙහි පැවැත්මේ හිමිකාරිය වන්නේ ද කාන්තාවයි. මෙහි දී වඩා වැදගත් වන්නේ කාන්තාවක සතුව පවුල තුළ පැවරුණු සියලු වගකීම් නිසි ලෙස ඉටු කරමින් ම ඇය තම සැමියාගේ හෝ පියාගේ ආර්ථික ක්‍රියාවලියෙහි සහය සේවිකාවක ලෙස හෝ ස්වකීයවම කුමන හෝ රැකියාවක නිරත වීමයි. එබැවින් ඇගේ ශ්‍රම දායකත්වය අගය කළ යුතුය.

වර්තමානයේ මෙන් ම අතීතයේ දී ද මිනිසාගේ ආර්ථික හා සමාජ ජීවිතය රැකී රක්‍ෂා රටාව මත ගොඩනැගී තිබිණි. එබැවින් කෘෂිකාර්මික අර්ථ

ක්‍රමය තුළ රටේ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් ම ජනතාවගේ රැකී රක්‍ෂා මත රඳා පැවති නිසා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම නිෂ්පාදනයේ කොටස්කරුවන් වීම අත්‍යවශ්‍යය විය. ඒ හැර පවුල තුළ පැන නැගෙන්නා වූ ආර්ථික ගැටලු මඟ හරවා ගැනීමට ද කාන්තාවගේ සේවා නියුක්තිය ඉතා වැදගත් විය.

අතීත ලංකාවේ කාන්තාවගේ සේවා නියුක්තියෙහි ස්වභාවය හඳුනාගැනීමේ දී සාහිත්‍යමය මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් මනා පිටිබලයක් ලැබේ. මෙම මූලාශ්‍රය තුළ විවිධ වූ පරාසයන් ඔස්සේ කාන්තාවන් රැකියාවන්වල නිරත වී සිටි බවට සාධක හමු වේ. වී ගොවිතැන, හේන් ගොවිතැන, සත්ත්ව පාලනය, කුඹල් කර්මාන්තය, කපු කර්මාන්තය, වෛශයා වෘත්තිය, උක් හකුරු කර්මාන්තය, දාසි මෙහෙය, රෙදි ඇපිල්ලීම, වෙළඳාම, ගුරු වෘත්තිය ඉන් ප්‍රධාන වූ කීපයකි. මෙම වෘත්තීන් තුළ කාන්තාවගේ ශ්‍රම දායකත්වය අධ්‍යයනය කිරීම තුළින් අතීත ලංකාවේ කාන්තාව පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේදී දක් වූ ශ්‍රම දායකත්වය හඳුනා ගත හැකිය.

අතීත ලංකාවේ වැසියාගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. ඒ තුළ කාන්තාවගේ සහභාගීත්වය ඒ ඒ කටයුතු සඳහා පමණකැයි සිතුව ද වී ගොවිතැන තුළ දී කාන්තා ශ්‍රම දායකත්වය පිරිමියා හා සම වූ විටෙක ඔහු අභිබවා යන්නක් විය. වී ගොවිතැන තුළ සිදුවන්නා වූ ක්‍රියාදාමය පිළිවෙළින් පෙළගැස්වුවහොත් බිම් සකස් කිරීම, ධාන්‍ය වැපිරීම, නෙළීම, වල් පැළ ගැලවීම, කෙත රැකීම, ගොයම් කැපීම, පෑගීම, පිදුරු සැළීම, සුළං කිරීම, ඇඹුල ගෙන යාම, වී බොල් පෙළීම, ධාන්‍ය වේලා ගබඩා කිරීම මෙන් ම වී තැම්බීම, කෙටීම, දහයියා හා සුනු සහල් වෙන් කිරීම හා ආහාර පිළියෙළ කිරීම ලෙස ප්‍රධාන කාර්යයන් දක්විය හැකිය. ඒ අතරින් බිම් සකස් කිරීම, වැපිරීම, ගොයම් කැපීම, පෑගීම හා ධාන්‍ය ප්‍රවාහනය වැනි

කාර්යයන් සඳහා පුරුෂයින්ගේ ශ්‍රම දායකත්වය උපරිම වුව ද ඉතිරි ක්‍රියාදාමයන් සියල්ලෙහිම උපරිම වූ ශ්‍රම දායකත්වයක් සපයන්නේ කාන්තාවන් විසිනි. එහෙත් පිරිමින් විසින් සිදු කළ මෙබඳු කාර්යයන් ද කාන්තාවන් අතින් සිදු වූ බවට සාධක මූලාශ්‍රය තුළින් හමුවේ.

එක්තරා දුගී ස්ත්‍රියක කංගු නම් වූ ධාන්‍ය පිර වූ ලබු කැටයක් ගෙන වැපිරීම සඳහා හේනට ගිය බව

**" තත්‍රෛකා දුග්ගතා ඉත්ථී - පොන්තිනන්ත නිවාසිනී**

**කංගුනං ලාබුං පූරෙත්වා - ඛෙත්තං ගච්ඡති වාපිතුං "**

**(සීහලවත්ථුප්පකරණං, 1959 , 20)**

ආදී වශයෙන් දක්වෙන බැවින් විවිධ වූ ආර්ථික දුෂ්කරතා හමුවේ කාන්තාවන් ද පිරිමින් විසින් සිදු කළ ධාන්‍ය වැපිරීමේ කාර්යෙහි නිරත වූ බව පැහැදිලිය. තව ද ගොයම් පැළ වැඩිපුර සිට වී ඇති ස්ථානවලින් ගලවා පාළු තැන්වල සිටුවීම නෙළීම නම් වේ. බොහෝ දුරට මෙම කාර්යය ද කාන්තාවන් අතින් සිදුවන්නකි. ඒ හැර නෙළීමේ නිරතවන අතරතුරේ දී වල් පැළෑටි ගැලවීම ද කාන්තාවන් විසින් සිදු විය. සද්ධර්මාලංකාරයෙහි නන්දිමිත්‍ර වස්තුවට අනුව මෙලෙස කිරි දෙන මවුන් පවා ළමුන් ද කර පින්නා ගෙන මෙම කාර්යයන්හි නිරත වූ බවට සාක්ෂි දරයි (සද්ධර්මාලංකාරය,1997, ,556-562).

එමෙන්ම, ගොයම් පැළ පීදී එන සමයේ පටන් ම වී පැසෙන එම කාලය පුරාම ගොවියා සතු වැදගත් ම කාර්ය වූයේ කෙත රැකීමයි. දහවල් සමයේ දී එය කාන්තාවන් අතින් සිදුවූවක් බවට මූලාශ්‍රය සහතික කරයි.

**" එකළ ඒ සිටාණෝ බොහෝ ඇල් කෙත් වපුරුවා ගොයම්**

පීදී පැසෙන අවස්ථාවෙහි ඒ තමන්ගේ දාස කුමාරිකාවක

කැඳවාගෙන ගොයම් රැකීමට යැවූහ.''

(සද්ධර්මාලංකාරය, 1997 ,181)

මේ අනුව දාස කුමාරිකාවක විසින් ගොයම් රැකීමට ගියේ නම් ආර්ථික අතින් පහළ මට්ටමක සිටි කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් සාමාන්‍ය වැසියාගේ බිරින්දෑවරුන් හෝ දූරියන් එම කාර්යයෙහි නිරත වීම ස්වභාවයෙන්ම සිදුවන්නකි. තවද කෙතක ගොයම් රැකි සිංහල දූරියක ගායනා කළ ජරා මරණ සංයුක්ත ගී අසා භික්ෂූන් හැට නමක් රහත් වූ බව වංගීස සංයුක්තයෙහි (සංයුක්ත නිකායට්ඨකථා,1924,211) කියවෙන බැවින් කාන්තාවන් තුළ තිබූ ආගමික ලැදියාව උසස් අධ්‍යාපනය මෙන්ම වී ගොවිතැනේ දී සහය වෙමින් ආර්ථිකයට දක් වූ දායකත්වය හඳුනා ගත හැකිය. මේ හැර ගොයම් කැපීම, වී බොල් පෙළීම, මෙන්ම පිදුරු සැළීම වැනි කටයුතු ද කමතේ දී කාන්තාවක අතින් සිදු වූ කාර්යයන් විය.

හේනේ කුඹුරේ වැඩ කරන පවුලේ උදවියට දිවා ආහාරය සකස් කොට රැගෙන යාම එදාමෙදා තුර කාන්තාව හට පැවරී තිබූ ප්‍රධානම වගකීමකි. ඒ පිළිබඳ සාධක මූලාශ්‍රය තුළ හමුවන්නේ පණ්ඩුකාභය රජුගේ සමයේ පටන්ය.

" සා මහාපරිවාරෙන යාන මාරුය්හ සොභනං

පිතුභත්තං ගාහයිත්වා ලාවකානඤ්ච ගච්ඡති"

(මහාවංසො, 2006, 10ඃ 31)

මේ ආදී වශයෙන් පණ්ඩුකාභය රජුගේ මාමා වූ ගිරිකණ්ඨශිව හට දුව පාලි කුමරිය තම පිරිවර සමඟ කුඹුරට බත් ගෙන ගිය අයුරු මහාවංසය අපූරුවට විස්තර කරයි. රාජ කුමාරිකාවන් මෙම කාර්යය සඳහා සහභාගී

වූයේ කලාතුරකින් වුවද ගැමි සමාජයේ සාමාන්‍ය කාන්තාවන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වූ බැවින් ඇඹුල ගෙන යාම අනිවාර්යය රාජකාරියක්ව තිබුණ බව දැක්විය හැකිය. සද්ධර්මරත්නාවලියෙහි ආහාර සකස් කොට කුඹුරට ගෙන යාම කාන්තාවක අතින් සිදු වූ අයුරු මෙසේ දැක්වේ.

**"ඒ වේලෙහි එක් ගෑණියක බත් පිස තබාලා මාළු දූමන ගමනේ "**

**"කුඹුරට හේනට බත් ගෙන යන කලත්......"**

**(සද්ධර්මරත්නාවලිය,2007,681)**

සිවුසැට කලාවන්ගෙන් එකක් වූ ඉවුම් පිහුම් කටයුතු මෙන් ම ඇඹුල ගෙන යාම ද එය බෙදාහදා දීම ද කාන්තාවන් හට පැවරුණු බවට මෙම නිදර්ශන සාක්ෂි දරයි. තමන් ද වෙහෙස වෙමින් ශ්‍රමය සපයනවා සේම කය වෙහෙසා වැඩ කරන අනෙක් පිරිසගේ ආහාර අවශ්‍යතාව ද සපයා දෙන බැවින් කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ගොවිතැනේ දී අත්‍යවශ්‍ය වූවක් බව කිව හැකිය. අස්වැන්න නෙළා ගැනීමෙන් පසු වී වේළා ගබඩා කිරීමේ කාර්යය ද ඉටුවූයේ ගෘහණිය අතිනි. මහලු කාන්තාවන් පවා වී අව්වේ දමා වේළීමේ යෙදුණු බව,

**" එකා මහල්ලිකා වීහිං - සොසෙතුං ආතපෙ බිපි "**

**(මහාවංසො, 2006, 21ඃ 27)**

මෙම ගාථා පාඨයෙන් පැහැදිලි වේ. වී කෙටීමෙහි නියුක්ත වූ කාන්තාවන් පිළිබඳ iv වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි ද සඳහන් වේ. එහි දී වී කොටන දාසිය ''වටිම්ඩි'' ලෙස දක්වා තිබේ.

" වට්මිඩි සූවිසි ජනකු ඉසා එක්නට් එක් පා බැ "

**(Epigraphia Zeylanica,Vol.1,1912, 109 )**

හේනේ කුඹුරේ වැඩ අධික වූ විටදී නිවසේ දෛනික කාර්යයන් කිරීමට කාලවේලා නොමැති වූ විටදී රාත්‍රි කාලයේ ද සේවාවන්වල නිරතවීමට කාන්තාවන්ට සිදු වූ බවට සාධක හමුවේ. සීහලවත්ථුප්පකරණයට අනුව,

**"රත්තිං කම්මං කරොන්ති - බහුකං දාන වත්ථු න හොන්ති**

**රත්තිං නිද්දා මා ආගච්ඡතු - මූසලානිමූපරි නිපජ්ජි "**

**(සීහලවත්ථුප්පකරණං, 1959, 146)**

මෙහි චන්ද්‍රා නම් දුගී ස්ත්‍රියක රාත්‍රි කාලයේදී වී කෙටීමෙහි, පෙළීමෙහි නිරත වූ බවත් ඇය වෙහෙසට පත්ව මොහොල් ගස් මතම නිදාගත් බවත් විස්තර කරයි. කෘෂිකර්මාන්තය තුළ අධික ලෙස වෙහෙසට පත් වන්නා වූ කාර්යය ප්‍රමාණයක් පිරිමියාට මෙන්ම ගැහැණියට ද උරුම වූ අයුරු ඉහත නිදර්ශන අනුව පැහැදිලිය. මෙම සියලු සාධක හා නිදර්ශන අනුව පැහැදිලි වන්නේ වී ගොවිතැන තුළ කාන්තාවගේ ශ්‍රම දායකත්වය උපරිම වූ අතර එය විටෙක පිරිමියා හා සම වූ විටෙක ඔහු අභිබවා යන්නක් බවයි. ඒ අනුව කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් පැවති අතීත ලංකාවේ කාන්තාවන් තම උපරිම වූ ශ්‍රම දායකත්වයක් සපයමින් පවුලේ ආර්ථික සුරක්ෂිතතාවක් ගොඩනගා ගැනීමට උරදුන් බව කිව හැකිය.

පැරණි ලක්දිව කාන්තාවන් පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දක් වූ ශ්‍රම දායකත්වය ඇගයීමේදී ඇය විසින් කුඹුරේ හේනේ මෙන්ම තම

ගෙවත්තේ සිදු කළ වගාවන් පිළිබඳවද අධ්‍යයනය කළ යුතුය. මන්ද, ඇය කුඹුරේ දී නොමසුරුව දහඩිය හලමින් බත සරිකරන්නා සේම කැකිරි, පුහුල්, ලබු, තියඹරා, රත්තම්පලා, බෝංචි, තිබ්බොටු වැනි එළවළු ද අඹ, වරකා, කෙසෙල්, උක්, බෙලි වැනි පලතුරු ද වගා කරමින් එදාවේලට අවශ්‍ය ආහාරය වියදමකින් තොරවම සපයා ගන්නා බැවිනි. එම ආහාරවල අතිරික්තය විකුණා අතිරේක ආදායමක් ද ලබා ගනිමින් කාන්තාවන් පවුලේ ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමට දායක වූවා සේම මූල්‍යයමය වටිනාකමක් ද ලබා ගැනීමට ක්‍රියා කළ බව පැහැදිලිය.

කෘෂිකාර්මික අර්ථ ක්‍රමය තුළ පශු පාලනය ද ආර්ථිකයේ වැදගත් අංශයක් වූ අතර මඩ ගොවිතැනේදී සහය සඳහා ගවයා ද පස්ගෝ රස ලබා ගැනීම සඳහා එළදෙනුන් ද ඇති කිරීම අත්‍යවශ්‍ය විය. එළදෙනුන්ගෙන් කිරි දොවා ගැනීමේ කාර්යය කාන්තාවන් අතින් සිදු විය. සද්ධර්මාලංකාරය හා රසවාහිනියට අනුව තිස්සා නැමැති කාන්තාවක උදේ හවා එළදෙනුන්ගෙන් කිරි දොවා ගත් බව කියවෙන්නේ මෙසේය.

" **ඉක්බිති ඒ දෙමහල්ලෝ පෙරවරු ලත් සතර නැලියක් පමණ ගිතෙල් ගෙන භික්ෂූන්වහන්සේට ගිතෙල් හා සමඟ බත් දෙති. පස්වරු ලත් ගිතෙලින් පහන් පූජාත් කොට........................** "

**(රසවාහිනිය, 2004, 45)**

මෙය ගරු කටයුත්තක් සේ සැලකූ නිසාම රජ බිසෝවරු පවා කිරි දෙවීමේ නිරත වූ බවට සාධක හමු වේ. සද්ධාතිස්ස රජුගේ බිසව කිරි දෙවීමේ දක්ෂ වූ බව (රසවාහිනිය, 2004, 13) කියවෙන අතර කලාතුරකින් කිරි දෙවූ රජ බිසෝවරුන්ට වඩා මෙම කාර්යයෙහි එදිනෙදා යෙදුණු සාමාන්‍ය කාන්තාවන් තුළ මනා නිපුණත්වයක් තිබුණා විය යුතුය. මේ අනුව නිවසේ

ඇති කර ගන්නා එළදෙනුන්ගෙන් නිවසේ අවශ්‍යතාවන් සපුරා ගත්තා සේම අතිරික්තය විකුණා ගනිමින් මුදල් උපයා ගැනීමේ මාර්ගයක් බවට කිරි දෙවීමේ කාර්යය යොදා ගන්නට ඇතැයි සිතිය හැකිය

වංසකතාවට අනුව ක්‍රිස්තු පූර්ව පස්වන සියවසේ දී විජය කුමරු ඇතුළු සත්සියයක් පිරිස ලක්දිවට ගොඩ බසින විටදී

**" කුවේණි නම් යකිණි තොමෝ කපු කටිනා තවුසියක සෙයින්**

**එහි රුක් මුලක හුන්නාය............................"**

**(මහාවංසය, 2006, 7: 11)**

මේ ආදී වශයෙන් කුවේණිය කපු කටිමින් සිටි බව සඳහන් බැවින් කපු කර්මාන්තය විජයාවතරණයට පෙර පටන්ම මෙරට ජනප්‍රියව තිබූ කර්මාන්තයක් බව පැහැදිලිය. අංගුත්තර නිකායේ උග්ගහ සූත්‍රයේ

**"යෙ තෙ භන්තු අබ්භන්තරෝ කම්මන්තා උණ්ණතිවා**

**කප්පාසොතිවා තත්ථ දක්ඛා භවිස්සාම"**

**(අංගුත්තර නිකාය, 1968, 58)**

යන මෙම ගාථාවට අනුව සෑම ගැහැණු දරුවෙකුම එළලොම් ගෙතීම, කපු කැටීම පිළිබඳ මනා නිපුණත්වයක් ලබා ගත යුතු බව සඳහන් වේ. එබැවින් අතීත ලංකාවේ කාන්තාවන් හට ඉතා හුරුපුරුදු වෘත්තියක් ලෙස කපු කැටීම පැවතුනා විය යුතුය. 'පෙහෙකර' යනු පේශ කර්මාන්තයේ යෙදුණවුන් ය. ගල්කන්දේගම (Inscriptions Of Ceylon, 1970, No1145, 91) හා හිට්ටාරගමහින්න (Inscriptions Of Ceylon, 1970, No 1160, 92) ශිලාලිපිවල "පෙහෙකර ගමක්" පිළිබඳව හා "පෙහෙකර " යන්න සඳහන්ව ඇති අතර ඒ අනුව පේශ කර්මාන්තය අතීතයේ පටන්ම ජනප්‍රියව පැවති

එකක් බව පැහැදිලිය. නූල් කැටීමෙහි කාන්තාවන් සතු වූ දක්‍ෂතාව පිළිබඳ සඳහන් කිරීමේදී භික්‍ෂුවක නිවසකට පිඩුසිඟා ගිය පසු ගෙයි ඉදිරිපස එම භික්‍ෂුව සිටිය යුත්තේ කාන්තාවක නූලක් සකස් කරන කාල සීමාව තෙක් පමණක් බව,

**"ගෙට ඉදිරිවැ සිටැ හු කටිනා මාගමක හුයක් කැටැගෙන පමණ කලක් සිටැ බික නොඅළහොත් ගෙය බලා............................... "**

**(සිබවළඳ විනිස, 2008, 89)**

යන ඉහත මූලාශ්‍රය පාඨයෙන් කියවෙන අතර ඒ අනුව නිවෙස්වල නූල් කැටීම බහුලව සිදු වූවා සේම ඒ සඳහා කාන්තාවකට ගත වූයේ ඉතාම සුළු කාලයක් බැවින් මෙම කාර්යයේ මනා නිපුණත්වයක් කාන්තාව සතුව තිබූ බව ය. ඒ අනුව අතීතයේ දී තම පවුලට අවශ්‍ය ඇඳුම් සකසා ගැනීම, ඇඳ පුටු ඇතිරිලි, බුමුතුරුණු, පලස් මෙන්ම කඨින චීවර පූජාවන් සිදුකිරීමට අවශ්‍ය රෙදිපිළි වියදමකින් තොරව නිවසේදීම කාන්තාවන් විසින් සපයා ගෙන ඇති අතර ඒවා විකුණා අතිරේක මුදලක් උපයන්නට ඇති බව ද කිව හැකිය.

අතීතයේ පටන් පැවත එන ඉතා ජනප්‍රිය ආහාරයක් ලෙස උක් හකුරු හා මී පැණි සැලකිය හැකිය. උක් ගස් ගෙවත්තේ වගා කොට ඒවා අඹරා තම්බා පැණි ලබා ගැනීම ගැමි කාන්තාවන් අතින් සිදු විය. හදිසියේ ම දනට වැඩි භික්‍ෂූන් පන්සියයකට උක් පැණි හා උක් සකුරු මිශ්‍ර ආහාරයක් සාදා ගොවි බිරියක විසින් පූජා කළ බව රසවාහිනිය දක්වන අතරම එයින් පැහැදිලි වන්නේ උක් පැණි නිවෙස්වල බහුල වූ සුරක්‍ෂිත ආහාරයක්ව පැවති බවයි.

**" සුධොත භාජන පත්ථා උච්ඡු බෙත්ත මුපාගම්**

උච්ඡුං සා තත්ථ භඤ්ජිත්වා සම්පිළෙතුං පවට්ටයි

ඉමං උච්ඡු මපිළයිං

නාළිපූරං රසං හොති ද්වින්නං පබ්බානම් තරෙ "

(සීහලවත්ථුප්පකරණං, 1959, 132)

මේ ලෙසට සීහලවත්ථුප්පකරණයෙහි ධම්මික රාජවත්ථුවේ උක් ගසක් තම අත්වලින් අඹරා පැණි ගත් බවක් කියවෙන අතර ඒ තුළින් කාන්තාවන්ගේ ශක්තිමත්භාවය මෙන්ම උක්පැණි නිෂ්පාදනය සඳහා තිබූ මනා නිපුණත්වය අවබෝධ කර ගත හැකිය.

මේ හැර කුඹල් කර්මාන්තය ද අතීත ලංකාවේ ප්‍රධාන වෘත්තියක් ලෙස පැවති බවට සාධක මූලාශ්‍රය තුළින් හමු වේ. සද්ධාතිස්ස රජුගේ සමයේ දී අනුරාධපුරයේ විසූ එක්තරා දුගී ගොවියෙකු දුවගේ සහයෙන් ගඩොල් කැපූ බව,

"ධීතා ච අත්තනො එකා - ඉධ කම්මේන ජීවතී "

(සීහලවත්ථුප්පකරණං, 1959, 121)

මෙසේ සඳහන් වන බැවින් කුඹල් කර්මාන්තයේදී ද කාන්තාවන් පුරුෂයාගේ කටයුතු සඳහා ශ්‍රම දායකත්වය උපරිමයෙන් ලබා දුන් බව පැහැදිලිය.

අතීත ලංකාවේ ක්‍රියාත්මක වූ වෘත්තීන් අතරින් ගණිකා වෘත්තිය කාන්තාවන් අතර ජනප්‍රිය වූවකි. මෙය රැකියාවක් ලෙස පැවති බවට සාධක

හමු නොවූවද ගණිකාවන් සිටි බවට තොරතුරු බොහොමයක් මූලාශ්‍රයවලින් හමුවේ. ඉන්දියාවේ මෙන් සම්භාවනීය බවක් ලංකාවේ ගණිකාවන්ට නොලැබුණ ද රජවරුන් පවා ඔවුන් වෙත ගිය බවට සාධක ඇත. සැස්සේරුව ශිලා ලිපියෙහි,

**" ශොබිකා නග කාමින මරුමනක නට චුලහ"**

**(Inscription of Ceylon, 1970, No 1010, 79)**

චූල නැමැති නළුවා තමා නගර සෝභනියකගේ මුණුබුරෙකු ලෙස දක්වා ඇති අතර ඒ තුළින් පූර්ව රාජ්‍ය සමයේ පටන්ම ගණිකාවන් සිටි බව ද මොවුනට සමාජයේ හෙළා දැකීමක් සිදු නොවූ බවද පැහැදිලිය. නිකාය සංග්‍රහය දක්වන පරිදි

**" සැදැහැ නැති දුෂ්ට මහණෙක් රාත්‍රී භාගයෙහි නිල් වස්ත්‍රයක්**

**පෙරවා වෛශ්‍යා වාසයකට ගොස් එහි ලැග.........."**

**(නිකාය සංග්‍රහය, 1997, 35)**

යන සඳහනට අනුව, මෙම සිදුවීම කුමාරදාස යුගයේ සිදුවූවක් බව දක්වා තිබේ. තවද කුමාර ධාතුසේන රජු හා ඉන්දියාවේ සිට පැමිණි තම මිත්‍ර මහා කවි කාලිදාසයන් එකම වෛශ්‍යාවක මුණ ගැසීමට ගොස් සිදු වූ අපූරු සිදු වීමක් පිළිබඳ ජනප්‍රවාදයේ එයි. එබැවින් අතීත ලංකාවේ ගණිකා වෘත්තියෙහි නියැලුණු කාන්තාවන් සිටියා මෙන්ම රජවරුන් පවා ඔවුන්ගේ පහස ලබා ගත්තාය යන්න තහවුරු වේ.

මහා තිත්ථයේ සිව ඇමතිවරයා කහවණු තුන්දාහක් සඳළුතලයේ සිටි ලඳකගේ පහස ලබා ගැනීමේ අරමුණින් යැවූ බව,

**''අලුත් සඳුන්මලි - ගිය මල් දම් බැර වරල්**

**අභිසරුවෝ සෙ දුහුල් හන් - සිසි රස්හි නො පෙණෙනුවෝ''**

**(සියබස්ලකර , 2002,227)**

මෙසේ පද්‍යයට නගා තිබේ. මෙකල සාමාන්‍ය කුලීකරුවෙකුගේ මසක වැටුප කහවණු පනහක් හැටක් වැනි සුළු ප්‍රමාණයකි. එහෙත් ගණිකාවක් විසින් එක රැයකට එමෙන් පනස් ගුණයකටත් වඩා ඉපයූ බව ඉහත සඳහනින් පැහැදිලි වේ. එහි සත්‍ය අසත්‍යතාව කුමක් වුව ද ගණිකාවන් ලෙස යෙදුණු ස්ත්‍රීන් විශාල මුදලක් ඉපයූ බවත් ඔවුන් සතුව විශාල ධනයක් ඒකරාශී වන්නට ඇති බවත් සිතිය හැකිය.

ධම්පියා අටුවා ගැටපදයෙහි ගණිකා, ගිණිය, ගිහිණිය, ගිණි, වේසි (ධම්පියා අටුවා ගැටපදය,1932,131/222) වැනි පද ගණිකාවන් හැඳින්වීම සඳහා යොදා ගෙන තිබේ. ඒ මෙසේය.

**"නගර සොභනා වණ්ණදාසි නුවර හොබවන වණ්දස් ගිහිණිය වූ සේයි"**

**(ධම්පියා අටුවා ගැටපදය,1932,222)**

වංසකතාවන් ගත් විට ඒවායෙහි රජ බිසෝවරුන් හෝ ප්‍රභූ පැළැන්තියේ කාන්තාවන් ගැන කියවෙන අතරම සාමාන්‍ය සමාජයේ කාන්තාවන් පිළිබඳ නොකියවෙන තරම්ය. එබැවින් අතීත ලංකාවේ කාන්තාවන් පිළිබඳ නිවැරදි ම තොරතුරු හමුවන ප්‍රධානම මූලාශ්‍රය ලෙස සීගිරි ගී වඩා වැදගත් වේ. මෙම සීගිරි ගී තුළ ගණිකාවන් හඳුන්වා ඇත්තේ අභිසරුලියන් ලෙසය.

**" බිසරියෙ වැසැරියුන කලුන ගැණින යුන සඳ**

**බලලනට රිසි මෙය නොවෙයි බෙ ය ගියනට"**

**(Sigiri Graffiti,1956 ,111)**

මෙහි සීගිරි ලඳුන් අභිසරුලියන් ලෙස හැසිරෙන විටදී බැලීම පවා අපහසු වූ බව කියයි. තවත් ගීයක කාන්තාවගේ අයහපත් හැසිරීම නිසා සැමියා සමඟ පැවති සබඳතාව බිඳී ගියා සේම කතුන් මෙසේ අනාචාරයේ හැසිරුනේ තම සැමියාගේ අතමිට හිඟකම නිසා ද යන්න විමසයි. එය මෙසේ පද්‍යයට නඟා තිබේ.

**ස්වස්ති**

**පිරිබුන හුණස්න විනා මෙසෙස් නසිනො අ**

**අයුයුන් හය් තී කළ කිමද හිමියා හිණ හිඟ දෑ**

**(Sigiri Graffiti,1956 ,384)**

පවුලේ ආර්ථික මට්ටම පහළ තත්ත්වයක පැවති කාන්තාවන් මුදල් ඉපයීමේ අරමුණින් ගණිකාවන් ලෙස හැසිරෙන්නට ඇතැයි මෙහිලා සිතිය හැකිය. වර්තමානයේදී වුවද ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවන් බොහොමයකගේ පවුල් පසුබිම විමසුවහොත් ඔවුන් දරිද්‍රතාවයෙන් පීඩා විඳින්නන් බව තහවුරු වේ. අතීතයේ ද ආර්ථික ගැටලු හමුවේ කාන්තාවන් අනාචාරයේ හැසිරෙමින් හෝ මුදල් ඉපයීමෙහි නිරත වූ බව සිතිය හැකිය. මේ අනුව පවුලේ පැවැත්ම උදෙසා ආර්ථික ශක්තිමත්භාවය කොතෙක් දුරට වැදගත් වන්නේ ද යන්න ද අවබෝධ වේ. තවත් සීගිරි ශිලාලිපියක තොසා නම් වූ වෛශ්‍යාව විසින් පූජා කළ ලෙනක් පිළිබඳ සඳහන් වේ (හෙට්ටිආරච්චි,එස්.බී,2008,241).

මෙම සියලු නිදර්ශන අනුව පැහැදිලි වන්නේ අතීත ලංකාවේ ප්‍රධාන මුදල් ඉපයීමේ මාර්ගයක් ලෙස ගණිකා වෘත්තිය කාන්තාවන් අතර ජනප්‍රියව පැවති බවත් අනෙක් සියලු වෘත්තීන්වල නියැලුණු කාන්තාවන්ට වඩා ගණිකාවන් ආර්ථික වශයෙන් පොහොසත් පිරිසක් ලෙස සමාජයේ ජීවත් වූ බවත්ය.

වෛශ්‍යාවන් මෙන්ම නාට්‍යාංගනාවන් ද විශාල ධනයකට හිමිකම් කියූ පිරිසක් ලෙස සැලකිය හැකිය. දුටුගැමුණු රජ දවස මහාථූපයේ ධාතු නිධානෝත්සවයේ දී රජුගේ නාට්‍යාංගනාවන් ලෙස සේවය කළ කතුන් තමන් පැළඳ සිටි කහවණු තිස් ලක්‍ෂයක් වටිනා රන් ආභරණ ගලවා පූජා කළ බව වංසකතාවේ සඳහන් වේ.

**''කායෙ ච සබ්බාලංකාරං - ධාතුගබ්හම්හි පූජයි**

**තථානාටකියො මච්චා - පරිසා දෙවතාපිච''**

( මහාවංසො, 2006, 31ඃ 112 )

මෙම කතුන් සුරූපිණියන් වූවා මෙන්ම විවිධ තරාතිරම් නියෝජනය කරන්ට ඇතැයි සිතිය හැකිය. ඒ අනුව නාට්‍යාංගනාවන් ලෙස සේවය කළ කතුන් ද ආර්ථික අතින් පොහොසත් පිරිසක් බව පැහැදිලිය. කාන්තාවන් විවිධ රැකියාවල නියුතු වූ බවට සාධක හමුවන වැදගත් මූලාශ්‍රයක් ලෙස මිහින්තලා පුවරු ලිපිය දැක්විය හැකිය. එහි සඳහන් පරිදි කාන්තාවන් රැකියාවල නියුතු වූවා මෙන්ම ඔවුන්ට සුදුසු පරිදි වැටුප් හා දීමනා දුන් බවද කියවේ. ජෙට්මවට ඉඩම් එක් පයක්ද ඉඩම් දිවෙල් සඳහා අඩමනාවක් හා පත දෙකක් හාල් ද දෙන ලද බව කියවේ.

**"ජෙට් මවට් එක් පයක් ඉසා සාල් එකඩ් මනා දෙපතක් ඉසා"**

(ශිලාලේඛන සංග්‍රහය,2000,47-50)

එස්.බී හෙට්ටිආරච්චි මහතා සඳහන් කරන පරිදි ජෙට්මව යනු ජ්‍යෝෂ්ඨ නිලධාරිනිය බව කියවේ (හෙට්ටිආරච්චි, එස්. බී, 2008, 144). බත්ගේ ලැදිය හට ඉඩම් එක් පයක් ද සහල් පත හා අඩමනාවක් ද දී ඇත. පැරැහැන්දි හෙවත් විහාරස්ථානයට පෙරහන් සැපයූ කාන්තාවට ඉඩම් එක කරියක්ද හාල් පය දෙකක් ද දී ඇත. එම දීමනාවම මඩවුව හෙවත් මැටි භාජන සැපයූ සේවිකාවට ද දී ඇත. මෙහි මිනිදි නමින් කාන්තාවන් විසිහතර දෙනෙක් විහාරයෙහි සේවය කළ බව කියවෙන බැවින් කාන්තාවන් විහාරාරාම සේවයේ නියුතු වෙමින් ද වේතන ලැබූ බව පැහැදිලිය.

පහත කියවෙන සීගිරි ගීයට අනුව ඇඳුම් පිරිසිදු කරන්නියක් ලෙස කතක් ස්වයං රැකියාවක නිරත වූ බව කියවේ.

**පිල අපුලන තොට නැත්තෙන් - හළුගර් නැත්තෙන්**

**වැ(ද) වෙසෙස් රිදියක් බෙයන්ද්හි - රන්වනුන් අතුරෙ**

**(Sigiri Graffiti, 1956,410)**

එමෙන්ම විසුද්ධිමග්ගය හා මහාවංසයට අනුව කතුන් රෙදි සේදීම්, මැදීම්, නූල් කැටීම් වැනි වෘත්තීන්වල නියැළී සිටි බවද කියවේ (Visuddhimaga, 1920, 21). මේ හැර සූප ශාස්ත්‍රය සෑම කාන්තාවකම ප්‍රගුණ කළ යුතු සිවු සැට කලාවන්ගෙන් එකක් විය.

විශේෂයෙන්ම භික්ෂුණීන් විසින් ගුරු වෘත්තියේ නියැළුණු බවට සාධක හමු වුවද පවුලේ ආර්ථිකයට එහි බලපෑමක් නොවුණ බැවින් ඒ පිළිබඳ කීමට මෙහිලා උත්සුක නොවීය. මල් මාලා ගෙතීම, උපස්ථායික සේවය, පරිවාර සේවාව, රාජ්‍ය සේවය, මෙන්ම විවිධ වූ වහල් සේවාවන් ඇතුළු වෘත්තීන් රාශියක් කරමින් කාන්තාවන් ආර්ථිකයට උපරිම දායකත්වය සැපයූ බව පැහැදිලිය. ඒ අනුව සමස්ත නිදර්ශන තුළින් පැහැදිලි වන්නේ

අනුරාධපුර යුගය කේන්ද්‍ර කර ගත් අතීත ලංකාවේ කාන්තාවන් තමා සතු පවුලේ වගකීම් හා යුතුකම් සියල්ල නොපිරිහෙලා ඉටුකළා සේම විවිධ වූ අංශයන් කරා යොමු වෙමින් රැකියාවල නිරත වූ බවයි. ඒ තුළින් සිදු වූයේ පවුලේ ප්‍රධාන අවශ්‍යතා වූ ආහාර, ඇඳුම් ඇතුළු බොහොමයක් ද්‍රව්‍ය වියදමකින් තොරවම සපුරා ගත හැකිවීමයි. තවද එම නිෂ්පාදන ද්‍රව්‍යවල අතිරික්තය වෙළඳාම් කිරීම තුළින් ද විවිධ වූ අයුරින් තම ශ්‍රමය ලබා දෙමින් ද මුදල් ඉපයීම සඳහා කාන්තාවන් ක්‍රියා කළ බවයි. ඒ තුළින් පවුලේ පැන නැගෙන ආර්ථික දුෂ්කරතා මගහැරුණා මෙන්ම ආර්ථික සුරක්ෂිතතාවක් ද ගොඩ නැගුණු බව පැහැදිලිය.

කාන්තාවන් පොදුවේ වී ගොවිතැන ද කපු කැටීම, කුඹල් කර්මාන්තය, වී කෙටීම, මල්මාලා ගෙතීම, උපස්ථායක සේවය, වහල් සේවය ඇතුලු විවිධ වූ වෘත්තීන්වල නියැළී සිටිමින් එම සේවාවන් සඳහා වේතන, දීමනා හා වරප්‍රසාද ලබා ගත් බව මූලාශ්‍රය තුළින් තහවුරු වන බැවින් අතීත ලංකාවේ කාන්තාවන් සතුව පෞද්ගලික ධනයක් තිබුණා විය යුතුය. ඒ පිළිබඳ සඳහන් කිරීමේ දී බෞද්ධ කාන්තාවන් තම ශ්‍රද්ධාව ප්‍රකාශ කිරීම සඳහා විවිධ වූ ප්‍රදානයන් සිදු කිරීමට දැක් වූ දායකත්වය අධ්‍යයනය කළ යුතුය. එහිදී විශේෂයෙන්ම රජ බිසෝවරු හෝ රාජකීය නිලතල දරුවන්ගේ පවුල්වල කාන්තාවන් විසින් කළ පරිත්‍යාගයන් සඳහන් කිරීමට උත්සුක නොවිය. එයට හේතු වූයේ ඔවුන්ගේ පවුල් සතුව විශාල ධනයක් තිබීමත්, මෙම කාන්තාවන් එම පවුලේ ධනය විය පැහැදම් කරමින් විවිධ වූ පරිත්‍යාගයන් සිදු කරන්නට ඇති බැවිනි. කෙසේ වෙතත් රාජකීය පවුල්වල හා උසස් නිලතල දරුවන්ගේ පවුල්වල කාන්තාවන් මහා පරිමාණයෙන් පූජාවන් සිදු කළ බවට සාධක වංසකතා තුළින් හමු වේ. එහෙත් වංසකතා තුළ නොකියූ පමණින් සාමාන්‍ය සමාජයේ කාන්තාවන් තම ධනය වියදම් කොට ආගමික පූජාවන් සිදු නොකළා යැයි කිව නොහැකිය. මන්ද, සාමාන්‍ය

කාන්තාවන් විසින් කළ පරිත්‍යාගයන් පිළිබඳ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සාක්ෂි දරණ බැවිනි. බ්‍රාහ්මණයාගම, පනික්කන්කුලම, කහටගස්දිගිලිය, කරඳගල , තිඹිරිවැව ආදී වූ ශිලා ලේඛන මේ සඳහා නිදර්ශන කිහිපයකි.

මහින්දාගමනයෙන් පසුව භික්ෂු භික්ෂුණී ශාසනය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස එම පිරිස් සඳහා වැඩ විසීමට වැඩි වැඩියෙන් ගල් ලෙන් සකස් කිරීමට අවශ්‍යය විය. එහිදී භාවනායෝගීව වැඩ විසීමට යෝග්‍ය වීම, පිටත ජලය නොඑන පරිදි කටාරම් කෙටීම, ගුහාව තුළ දොර ජනෙල් ආදිය සකස් කිරීම, පසු කාලයේ දී බිතුසිතුවම් ඇඳ අලංකාර කිරීම මෙන්ම එම පූජාවන් සඳහන් කර ශිලාලිපි පිහිටුවීම සිදු විය. මෙම පහසුකම් ඇතිව ලෙනක් සකස් කොට පූජා කිරීමට නම් පූජා කරන්නා තුළ ඒ සඳහා වියදම් කිරීමට තරම් ආර්ථික ශක්තිමත්භාවයක් තිබිය යුතුය.

මහාචාර්ය පරණවිතාන මහතා මෙන්ම ඒ ඇසුරු කොට ගෙන ඉන්ද්‍රාණි මුණසිංහ මහත්මිය පෙන්වා දෙන්නේ පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියවුණු ලෙන් ලිපි 1234 ක් අතරින් කාන්තාවන් විසින් පූජා කළ ලෙන් 222 ක ප්‍රමාණයක් ඇති බවයි. ඇය වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ ඒ අතරින් එකසිය තිස් හතර දෙනෙක් "උපශික" යන නාමය භාවිත කර ඇති බවයි. ඒ හැර රාජකීය කතුන් තිස් දෙකක් ද කුල කාන්තාවන් නවදෙනෙකු ද භික්ෂුණීන් එකොළහක් හා සාමාන්‍ය කතුන් තිස් හතර දෙනෙකු විසින් මෙම පූජාවන් කර ඇති බව දක්වා තිබේ (මුණසිංහ, 2007, 43) මෙම පර්යේෂණයෙහිලා වඩා වැදගත් වූයේ සාමාන්‍ය පංතියේ කාන්තාවන් තිස් හතර දෙනෙකු විසින් ලෙන් පූජා කර තිබීමයි. එබැවින් එම කතුන්ට ලෙන් පූජා කිරීමට තරම් ආර්ථික ශක්තියක් තිබිය යුතුය. තම පවුලේ විය පැහැදම් සඳහා යොදා ගෙන ඉන් ඉතිරිය මෙසේ තම ශ්‍රද්ධාව සඳහා යොදා ගන්නට ඇත.

ඒ අනුව මෙම කතුන් කුමන හෝ රැකියාවක නියුතු වෙමින් පවුලේ කටයුතු සඳහා සහය වූවා මෙන්ම තමා සන්තකව තබා ගත් ඉතිරියෙන් ආගමික ශ්‍රද්ධාව ප්‍රකාශ කිරීම උදෙසා භික්ෂූන් අරබයා ලෙන් පූජා කරන්නට ඇති බව කිව හැකිය. මේ හැර විහාරාරාම ඉදිකිරීම් හා ඒවා සඳහා විවිධ වූ පරිත්‍යාගයන් කළ බවට සාධක ශිලාලිපිවලින් ලැබේ. බ්‍රාහ්මණයාගම ලෙන් ලිපියට අනුව, අනුදි හා චිත්තා නැමැති කාන්තාවන් දෙදෙනා විසින් ඉදි කරන ලද විහාරයක් පිළිබඳ කිය වේ (**Inscriptionss of Ceylon, 1970, No 161c,).** විහාරාරාම ඉදි කළා මෙන්ම භික්ෂූන්වහන්සේලා සඳහා විවිධ වූ පහසුකම් සපයා දීමට ද කාන්තාවන් තම ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය ද සැපයූ බවට සාධක තිබේ. පනික්කන්කුලම ශිලාලිපියට අනුව,

**"උපශික තිශය පදගඩි"**

තිස්සා නැමැති කාන්තාවක විසින් පඩි පෙළක් සෑදූ බව සඳහන් කරයි. තව ද, පර්වත කාලගේ දුව වූ සේලාබ විසින් ගල් පඩි ඉදි කළ බව බණ්ඩාරදූව පර්වත ලිපියේ සඳහන් වේ (Dias, M., 1991, No 2756, p17). එමෙන්ම පැරණි ලක්දිව කාන්තාවන් තම ශ්‍රද්ධාව ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත් තවත් ක්‍රමවේදයක් වූයේ තමා සතු ගම්බිම් විහාරාරාමවල නඩත්තුව සඳහා පූජා කිරීමයි. ඒ සඳහා නිදර්ශන ශිලාලේඛනවලින් ලැබේ. කහටගස්දිගිලිය පර්වත ලිපියට අනුව ( **Epigraphia Zeylanica ,Vol iv, 1943, No 40)** වහබ නම් වූ ගුරුවරයාගේ දුව වූ මහසි සතුව තිබූ කුබරවිය වැවේ මසුන් ඇල්ලීමෙන් තමාට ලැබුණු ආදායම මාගම විහාරයෙහි භික්ෂූන්ට පූජා කළ බව සඳහන් වී තිබේ. තවද තිඹිරි වැව ශිලාලිපියට අනුව ද මිත්තා නැමැත්තාගේ දුව වූ අනුලා විසින් තමාගේ පවුල සතු ආදායම හා වැවක මසුන් ඇල්ලීමෙන් ලැබෙන බද්ද ගගපවත විහාරයට පූජා කළ බව සඳහන් වේ (**Epigraphia Zeylanica,Vol.II, 1928, 14** ), කරදගල විහාර ලිපියට අනුව ද

**''හබුතගල විහරහි කකවණ තිශ මහ රජ**

**උවසික මත තුමහ වචි සගදිනෙ ම (හ) ව''**

(ලක්දිව සෙල්ලිපි, 1969, 60)

මිත්තා නම් උපාසිකාව තමා සතු වූ වැවක් හබුතගල විහාරයට පූජා කළ බව කියවෙන අතර මෙබඳු නිදර්ශන රාශියක් ශිලාලිපි තුළින් හමු වේ. විවිධ පූජාවන් සිදුකළා මෙන්ම කාන්තාවන් සතුව චංචල හා නිශ්චල දේපොළ පැවති බවට මෙබඳු සාධක බොහොමයක් මූලාශ්‍රයවල ඇත. අග්බොයි නැමැත්තෙකු ලියූ සීගිරි ගීයකට අනුව සාතා නම් කාන්තාව සතුව නිවසක් තිබූ බව **(Sigiri Graffiti, 1956, 286)** කිය වේ. එමෙන්ම දළමෙයිසුර නම් කාන්තාවට ද මහවල ගමේ නිවසක් තිබූ බව සඳහන් වේ **(Sigiri Graffiti,1956 ,286)** .

කාන්තාවන් විසින් සිදු කළ පරිත්‍යාගයන් පිළිබඳ මූලාශ්‍රය තුළ බොහෝ සාධක හමුවන අතර එම සාධක තුළින් පැහැදිලි වන්නේ අතීත ලංකාවේ කාන්තාවන් විවිධ වූ රැකියාවල නිරතවෙමින් මුදල් ඉපයූවා මෙන්ම ඉතිරි කර ගත් මුදල් වියපැහැදම් කරමින් ආගමික කටයුතු සඳහා උපරිම වූ දායකත්වයක් සැපයූ බවයි.

අතීත ලංකාවේ කාන්තාවන් විවිධ වූ රැකියාවන්වල නිරත වූ බවට හමුවන සාධක මෙන්ම ඔවුන් විසින් මුදල් වැය කොට විවිධ වූ ආගමික පූජාවන් සිදු කළ බවට හමුවන සාධක සියල්ල තුළින් එළඹිය හැකි නිගමන කිහිපයකි. එනම් වී ගොවිතැන තුළ කාන්තාවගේ ශ්‍රම දායකත්වය පිරිමියා හා දෙවන වූවකට වඩා පිරිමියා හා සම වූ විටෙක ඔහු අභිබවා යන්නකි. එමෙන්ම ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමේදී ද පිරිමියා හා සමාන වූ හා කාර්යභාර්යයක් කාන්තාවක අතින් සිදු වේ. ඔවුන් වේතන ලබන රැකියාවල නිරත වූවා මෙන්ම චංචල හා නිශ්චල දේපොළ උරුමක්කාරියන් ද විය. තවද පවුලේ ආර්ථික ශක්තිමත්භාවය සඳහා පුරුෂ පක්ෂයට කාන්තාවගේ සහය

නොමසුරුව ලැබුණු බවද ඇය විවිධ වෘත්තීන්වල නිරත වූ හෙයින් කෘෂිකාර්මික සමාජයක අවශ්‍යතාවනට සරිලන පරිදි ගෘහ ජීවිතය සුව පහසුව සකස් කර ගනු ලැබූ බවද පැහැදිලිය.

## ආශ්‍රේය ග්‍රන්ථ


- **අංගුත්තර නිකාය** (1968), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ
- **ඍග්වේද සංහිතා** (1996), සාතබලේකර, වාරාණසි
- **ධම්පියා අටුවා ගැටපදය** (1932), ජයතිලක, ඩී. බී. (සංස්.), කොළඹ
- **නිකාය සංග්‍රහය** (1997), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල
- **මනුස්මෘතිය** (1984), ශ්‍රී නරංග්වින්ද ශාස්ත්‍රි, වාරාණසි
- **මහාවංසො** (සංස්.),(2006), ඉලංගසිංහ, මංගල, කොළඹ
- **මුණසිංහ, ඉන්ද්‍රානි** (2001), පැරණි ලක්දිව කාන්තාව, දෙහිවල
- **රසවාහිනිය** (සංස්.),(2004), ගුණරත්න, එල්. කොළඹ
- **සංස්කෘතික ඉතිහාසය** (2008), නුගේගොඩ, 1999
- **සංයුක්ත නිකායට්ඨකථා** (1924), පියතිස්ස හිමි, විදුරුපොළ, කොළඹ
- **සද්ධර්මරත්නාවලිය** (2007), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, කොළඹ
- **සද්ධර්මාලංකාරය** (1997), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ
- **සිඛවළඳ හා සිඛ විනිස** (2008), ගුණවර්ධණ, වි. ඩි. එස්., කොළඹ

- **සීහළවත්ථුප්පකරණය (සංස්.)**,(1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, කොළඹ
- සෙනෙවිරත්න, නාගොඩ (1989), **මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය**, කොළඹ
- හෙට්ටිආරච්චි, ඒස්. බි. (2008), **ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය**, නුගේගොඩ
- **Epigraphia Zelanica**, Vol.i (1912), De Silva, D. M., London
- **Epigraphia Zelanica**, Vol.ii (1928), Wickramasinghe, De Silva., London
- **Epigraphia Zelanica**, Vol.iv. (1943), Paranavithana, S., London
- Dias, Malani (1991), **Epigraphical Notes**, Department of Archaeology, Colombo
- **Sigiri Graffiti** (1956), Paranavithana, S., London
- **Visuddhimagga** (1920), Rhys Davids, C.A.F., London